# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය

| 7 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලයඃ පැය 2 |
|---|---|---|

1.බුදුරජාණන් වහන්සේ අනිමස ලෝචන පූජාව හෙවත් සතියක් බෝධීන් වහනසේ දෙස ඇසිපිය නොහෙලා බලා සිටියේ,

i.පළමු වන සතියේ ය. ii.දෙවන සතියේ ය.
iii.තෙවන සතියේ ය. iv.හතරවන සතියේ ය.

2.බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනය,

i.අනන්ත ලක්ඛණ සූත්‍රයයි. ii.මහා මංගල සූත්‍රයයි
iii.දම්සක් පැවතුම් සූත්‍රයයි. iv.කරණීය මෙත්ත සූත්‍රයයි

3.බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථාවකි

i.පූතිගස්සතිස්ස තෙරුන් ii.සෝපාක
iii.අසරණ මහළු පියෙක් iv.වරදට හසු වූ නිවැරදි ගොවියෙක්

4. බුදුගුණ අලංකාරය රචනා කරන ලද්දේ,

i.වෑත්තෑවේ හිමි ii.වීදාගම මෛත්‍රිය හිමි
iii.ඇම්.ඇල්.සිල්වා ගුරු මුහන්දිරම් තුමා iv.තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

5.බුදු ගුණ ගණන වන්නේ,

i.6කි ii.7කි
iii.8කි iv.9කි

6.සියලු කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින්, යහපත් ගමන් ඇති හෙයින් සහ සුන්දර වූ වචන ප්‍රකාශ කරන හෙයින්ද, බුදුරජාණන් වහන්සේ,

i.සුගත නම් වන සේක ii.සම්මා සම්බුද්ධ නම් වන සේක
iii.ලෝකවිදූ නම් වන සේක iv.භගවා නම් වන සේක

7."සෝපාකට"පිහිට වීම බුදුරජාණන් වහන්සේගේ,
i.අසරණ සරණ ගුණය ප්‍රකට කරයි
ii.ගිලනුනුට උපස්ථාන කිරීම ප්‍රකට කරයි
iii.ඉවසීම ප්‍රකට කරයි
iv.නායකත්වය ප්‍රකට කරයි

8.චාරිත්‍ර ශීලය යනු,
i.වැරදි දේ බැහැර කීරීමයි
ii.විරිත් බැහැර කීරීමයි
iii.සිරිත් අනුගමනය කිරීමයි
iv.විරිත් අනුගමනය කිරීමයි

9.විහාරස්ථානයේදී අනුගමනය කළ යුතු සිරිතක් වන්නේ,
i.හිස් වැසුම් පාවහන් ගලවා ඇතුළු වීමයි
ii.කෙස්,නියපොතු කපා පිළිවෙළට කොණ්ඩය පීරා තිබීමයි.
iii.පාවිච්චි කළ ජල බඳුනේ ජලය ඉතිරි නොකිරීමයි
iv.තමා භාවිතා කළ ඇඳුම් පැළඳුම් නිසි තැන්වල තැබීමයි

10.තුන් සූත්‍රය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න
i.අන්නත ලක්ඛණ සූත්‍රය, රතන සූත්‍රය, මහා මංගල සූත්‍රය
ii.දම්සක් පැවතුම් සූත්‍රය, රතන සූත්‍රය, අන්නත ලක්ඛණ සූත්‍රය
iii.කරණීය මෙත්ත සූත්‍රය, මහා මංගල සූත්‍රය, දම්සක් පැවතුම් සූත්‍රය
iv. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය,කරණීය මෙත්ත සූත්‍රය

11.මෙත් වඩන්නකු තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ,
i.කීකරු කම
ii.අනතිමානී බව
iii.ප්‍රඥාවෙන් තොර වීම
iv.ලද දෙයින් සතුටු වීම

12."මිගාර මාතා" නමින් ප්‍රසිද්ධ වූයේ,
i.සුමනා දේවියයි
ii.සුජාතා සිටු දේවියයි
iii.ප්‍රජාපතී ගෝතමී දේවියයි
iv.විශාකා සිටු දේවියයි

13.ජේතවනාරාමය පූජා කරන ලද්දේ,
i.අනේපිඬු සිටුතුමා
ii.විශාකා සිටු දේවියයි
iii.තපස්සු භල්ලුකය
iv.උපතිස්ස කෝලිතය

14.සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්ථා යන්නෙහි අදහස වන්නේ,
i.සියලුම සත්වයෝ නිදුක් වෙත්වා යන්නයි
ii.සියලුම සත්වයෝ සුවපත් වෙත්වා යන්නයි
iii.සැහැල්ලු පැතුම් ඇති බවයි
iv.ලද දෙයින් සතුටු විය හැකි බවයි

15. වරද නොම දන්නා
කී විට නොපිළිගන්නා
අපා ගති වන්නා
අසයි ගුණ දොස් සුගති වන්නා
මෙය ඇතුලත් ග්‍රන්තය වන්නේ,

i.සිරිත් මල්දම ii.බුදු ගුණ අලංකාරය
iii.ලෝ වැඩ සඟරාව iv.සුභාශිතය

16.අනේපිඬු සිටුතුමා පූජා කළ ආරාමය වන්නේ,
i.වේළුවනාරාමය ii.ජේතවනාරාමය
iii.ඝෝෂිතාරාමය iv.පූර්වාරාමය

17.කිරිපලු නුගරුක මුල වැඩ සිටි බුදුරජාණන් වහන්සේට අත්සුණු හා මී පිඬු පූජා කළේ,
i.සහම්පති බ්‍රහ්මයා ii.සුජාතා සිටු දේවිය
iii.උපක ආජීවක iv.තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයෝ

18. බෞද්ධයාගේ අත්පොත වශයෙන් හඳුන්වන ග්‍රන්තය කුමක්ද?
i.ධම්මපදය ii.සිරිත් මල්දම
iii.බුදු ගුණ අලංකාරය iv.කාව්‍යශේකරය

19.බුදු දහමට අනුව අප තවත් කෙනෙකුට ගරු කළ යුත්තේ,
i.කුලය නිසාය ii.බලවත්කම නිසාය
iii.ගුණ නුවණ අනුවය iv.ධනවත්කම නිසාය

20.බුදු සසුනේ අග්‍ර දායකයා සහ දායිකාව පිළිවෙලින් දැක්වෙනුයේ,
i.උපතිස්ස,කෝලිතය ii.තපස්සු,භල්ලුක වෙළඳ දෙබෑයන්
iii.උරුවේල කාශ්‍යප හා නදී කාශ්‍යපය iv.අනේපිඬු සිටුතුමා සහ විශාකා සිටු දේවියයි

පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්ණ 04 කට පිළිතුරු සපයන්න

1 i.අගසව් දෙනම නම් කරන්න
ii.පළමු ධර්ම දේශනය පැවැත්වූයේ කෙහේද?
iii.බුදු රදුන් අසරණ කාන්තාවනට පිහිට වූ අවස්ථාවක් ලියන්න
iv.අනුසෝතගාමී යන්න පැහැදිලි කරන්න
v.බුදු ගුණ 02ක් ලියන්න
vi.චාරිත්‍ර වාරිත්‍ර යන්නට සමාන පද දෙකක් ලියන්න
vii.බද්ධ පර්යංකය යනු කුමක්ද?
viii.සුදත්ත යනු කවුරුන්ද?
ix.ධම්මපදය අයත් පිටකය හා නිකාය නම් කරන්න
x.බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව කුමක්ද?

(2x10 = 20)

2 i.බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා 05ක් ලියන්න
ii.උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 05ක් ලියන්න

(5x2 = 10)

3 i. ....................................

......................................

යේ තං උපනයිහන්ති

වේරං තෙසං න සම්මති

ගාථාව සම්පූර්ණ කරන්න

ii.එහි තේරුම ලියන්න

(5x2 = 10)

4 i.මංගල උත්සවයට පෙර දින රාත්‍රියේ ධනංජය සිටුතුමා විශාකා සිටු දියණියට යුග දිවිය සාර්ථක කර ගැනීමට දුන් උපදෙස් දහයෙන් 05ක් ලියන්න
ii.විශාකා උපාසිකාවගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ 05ක් ලියන්න

(5x10 = 10)

5 i.අනේපිඬු සිටුතුමාගේ දියණියන් තිදෙනා නම් කරන්න

ii.අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ 05ක් ලියන්න

(5x10 = 10)

6 i.නිවසේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 05ක් ලියන්න

ii.විහාරසථානයේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 05ක් ලියන්න

(5x10 = 10)